

# අපේ හඬ වැදගත්:

## විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තරුණ කාන්තා නායිකාවන් ශක්තිමත් කිරීම

Centre for Equality and Justice

NDI
NATIONAL DEMOCRATIC INSTITUTE

# අපේ හඬ වැදගත්:

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තරුණ කාන්තා
නායිකාවන් ශක්තිමත් කිරීම



# පසුබිම

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) යනු ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව කටයුතු කරන කොළඹ නගරයේ පිහිටා ඇති කාන්තා සංවිධානයකි. සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රයෙහි මෙහෙවර වන්නේ ස්ත්‍රීන්, පුරුෂයන් සහ සුළුතර ලිංගිකයන් නිදහස්, සාධාරණ සහ සමාන සමාජයක ජීවත් වන බව සහතික කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යුක්තිය සාක්ෂාත් කිරීම වේ. එහි අරමුණු වන්නේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ බිම් මට්ටමේ කාන්තා ජාල සමඟ හවුල්කාරිත්වයන් ඇති කරගැනීමයි.

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයේ (NDI) මූල්‍ය අනුග්‍රහය සහිතව "අපේ හඬ වැදගත්: විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තරුණ කාන්තා නායිකාවන් ශක්තිමත් කිරීම" නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. යාපනය, කොළඹ, පේරාදෙණිය සහ අග්නිදිග විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් (විශේෂයෙන් කාන්තා උපාධි අපේක්ෂිකාවන්) ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය පිළිබඳ කතිකාවතට සම්බන්ධ වීම දිරිගැන්වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, පහත සඳහන් අරමුණු සපුරාලීමට මෙම ව්‍යාපෘතිය උත්සාහ කරයි.

1. ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප, මූලධර්ම සහ සම්මතයන් පිළිබඳ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවන් දැනුවත් කිරීම

2. විශ්වවිද්‍යාල සංගම්, සමිති සහ කමිටු තුළ නායකත්ව භූමිකාවන් දැරීමට විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් දිරිමත් කිරීම

3. විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් හට නීති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමග ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කළ හැකි වේදිකා නිර්මාණය කිරීම

විශ්වවිද්‍යාල සිසුන් විසින් අනුරාධපුර, මඩකලපුව, මහනුවර සහ යාපනය යන ප්‍රදේශවල කාන්තාවන් සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී ඔවුන් හඳුනාගත් ගැටලු ඉස්මතු කරමින් ලොබි ලේඛනයක් සකස් කර ඇත. ප්‍රජාව තුළ වෙසෙන කාන්තාවන් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව දැනුවත් වීම සහ මෙම ගැටළු විසඳීම සඳහා ක්‍රියා කල හැකි නිර්දේශ ගොඩනැගීම සඳහා ලබාගත් දැනුම භාවිතා කිරීම මෙම සාකච්ඡාවල අරමුණ විය.

උපාධි අපේක්ෂකයින් විසින් සකස් කරන ලද ලොබි ලේඛනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ තෝරාගත් මන්ත්‍රීවරුන්ට, විශේෂයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ කාන්තා සංසදය වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම ඉදිරිපත් කිරීමේ පරමාර්ථය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ ක්‍රියාකාරී නායකයින් වීමට උපාධි අපේක්ෂකයින්, වැඩි වශයෙන් කාන්තා සහභාගිවන්නන් දිරිමත් කිරීම සහ අනාගතයේදී කාන්තා නීති සම්පාදකයින් බවට පත්වීම සඳහා ඔවුන්ගේ හැකියාවන් හඳුනාගෙන ඒවා වැඩි දියුණු කිරීමයි.

# ගිලිහුණු මතක: යුද්ධයෙන් පසු කාන්තාවන්ගේ තත්ත්වය

## සාරාංශය

මෙම ලේඛනය ශ්‍රී ලංකාවේ පැවති ජනවාර්ගික ගැටුමෙන් පසු, මෙරට ප්‍රදේශ හතරක, කාන්තාවන්ගේ තත්ත්වය, ඔවුන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි එහි බලපෑම් සහ අභියෝග මධ්‍යයේ වුවද ඔවුන්ගේ අඛණ්ඩ ප්‍රත්‍යස්ථිතිය පිළිබඳ ගවේෂණය කරයි. එය ඔවුන්ගේ අභිලාෂයන් සහ ඔවුන්ගේ ජීවනෝපාය ගැටළු විසඳීම සඳහා ඔවුන් රජයෙන් බලාපොරොත්තු වන සහයෝගය/සහන/හානිපූරණයන්ගේ ස්වභාවය නිරූපණය කරයි. රජය විසින් තම දුක්ගැනවිලි සඳහා වගවීම සහතික කර ඔවුන්ගේ ඉල්ලීම් සහ අවශ්‍යතා සපුරාලනු ඇතැයි වින්දිතයින් අපේක්ෂා කරන්නේ කෙසේදැයි මෙම ලේඛනය මඟින් තවදුරටත් ගවේෂණය කරයි. අවසාන වශයෙන්, මෙය ප්‍රතිපත්තිමය ඇඟවුම් සහ නිර්දේශ ඉදිරිපත් කරයි.

## හැඳින්වීම

තිස් අවුරුදු යුද්ධයෙන් ශ්‍රී ලංකාව අත්විඳි බොහෝ විනාශයන් අතර, 2009 න් පසු කාලවකවානුව තුල කාන්තාවන්ගේ තත්ත්වය සැබවින්ම කණගාටුදායකය. මෙම කාන්තාවන් අවදානම් තත්වයට පත්වූ අතර, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ ඥාතීන්ගෙන් බොහෝ දෙනෙක් තුවාල ලැබූ, අතුරුදන් වූ හෝ මිය ගිය තත්වයන් තුල කාන්තාවන් හට ගෘහ මූලිකයන් බවට පත් වීමට සිදුවිය. මෙම කාන්තාවෝ දේශපාලන, ආර්ථික හෝ සමාජීය වශයෙන් විවිධ මට්ටමේ අභියෝග රැසකට මුහුණ දෙති. යුද්ධයෙන් සිදු වූ හානිය හුදෙක් දේපළ හා ජීවනෝපායන් අහිමි වීමෙන් ඔබ්බට විහිදේ. ඔවුන්ට මූලික අවශ්‍යතා සහ රැකියා සඳහා ප්‍රවේශය සහ මූල්‍යමය ස්ථාවරත්වයක් නොමැත. ඔවුන් තම පවුල් නඩත්තු කිරීමේ සහ දරුවන් ඇති දැඩි කිරීමේ බර කරට ගනිමින් කිසිදු සහායක් නොමැතිව හුදකලාව ඇත. මෙම ලේඛනය යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් මුහුණ දෙන ඉතා ඉක්මනින් විසඳා ගත යුතු බරපතල ගැටළු කිහිපයක් සාකච්ඡා කිරීම අරමුණු කරයි. එය ප්‍රධාන නිරීක්ෂණ පිළිබිඹු කරන අතර ප්‍රදේශ හතරක පවත්වනු ලබන උපදේශනවලට අදාලව ගැටලු හඳුනා ගනී.

| ප්‍රදේශය | සහභාගීවන්-නන් සංඛ්‍යාව | විස්තරය |
|---|---|---|
| අනුරාධපුරය | 9 | සහභාගීවූ කාන්තාවෝ ගුරුවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මෙන්ම කාන්තා සංවිධානවල නියෝජිතයන් වැනි බලධාරීන් වූහ.<br><br>සහභාගිවන්නන් තම පුද්ගලික නිරීක්ෂණ සහ අන් අයගේ අත්දැකීම් මත පදනම්ව තොරතුරු හුවමාරු කර ගන්නා ලදි. හඳුනාගත් බොහෝ ගැටලු පුද්ගලික අත්දැකීම් නොව පොදුවේ ප්‍රදේශයේ බහුලව දක්නට ලැබුණු ඒවා විය. |
| නැගෙනහිර පළාත | 9 | සහභාගීවූ කාන්තාවන් රැකියා විරහිත හෝ ස්වයං රැකියාවන්හි නිරත වූවන් විය.<br><br>ඔවුන් විවාහක හෝ දික්කසාද වූ අය වූ අතර ඇතැමුන් තම දරුවන් නිවැස් වලින් බැහැරව ගොස් ඇති බැවින් හුදකලාව සිටින අය වූහ. සියල්ලෝම පාහේ දරිද්‍රතාවය, මූල්‍යමය අස්ථාවරත්වය සහ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පීඩාවට පත් වූ අය වෙති. |

| | | |
|---|---|---|
| කිලිනොච්චිය | 10 | මෙම කාන්තාවෝ මීට පෙර සමෘද්ධිමත් ජීවිතයක් ගත කළ, එල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයින්ට සම්බන්ධ අය වූහ. ඔවුන් ජීවනෝපාය මාර්ගයන් සහිත, තෘප්තිමත් පවුල් ජීවිත ගතකල මූල්‍යමය වශයෙන් ස්ථාවරත්වයක් පැවති අය වූහ. කෙසේ වෙතත්, පශ්චාත් යුධ සන්දර්භය තුළ ඔවුන් අසරණ භාවයට පත්ව ඇත. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) සමඟ මීට පෙර පැවති සම්බන්ධකම් හේතුවෙන් මෙම කාන්තාවන් අගතියට පත්ව ඇත. ඔවුන් තමන්ගෙන් පලිගනීවියි යන බියෙන් යුතුව ජීවත් වෙති. |
| මධ්‍යම පළාත | 15 | මෙම කාන්තාවෝ වතු කම්කරුවන් වූ අතර ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ තේ වතුවල වැඩ කිරීමයි.<br><br>මූලික වශයෙන් විවිධ රැකියා අවස්ථා සොයා ගැනීමට හෝ ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඇති නොහැකියාව සහ අධ්‍යාපනයට ප්‍රවේශය නොමැතිකම හේතුවෙන් ඔවුන් වතු රැකියාවෙන් ඉවත් වීමට කිසිදු ක්‍රමයක් නොමැතිව පරම්පරා ගණනාවක් තිස්සේ “ලයින් කාමර”[1] තුළ ජීවත් වෙති. |

## ප්‍රධාන නිරීක්ෂණ

- පරිපාලන ව්‍යුහයන් සහ සමස්ත දේශපාලන නායකත්වය පිළිබඳ වර්ධනය වන කලකිරීම.
- ප්‍රජාතන්ත්‍රවාදී සාක්ෂරතාව නොමැතිකම සහ රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් වගකීමට නතුකිරීමට අසමත් වීම.
- ඔවුන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව කාන්තාවන් තුළ අවබෝධයක් නොමැතිකම. රජයේ සහන සහ වන්දි ලබාදීමේ විධිවිධාන පිළිබඳව ඇති නොදැනුවත්කම.
- දූෂිත පරිපාලන ව්‍යුහයන් මහජනතාවගේ නොදැනුවත්කම සහ අසරණභාවය අවභාවිතා කිරීම.
- යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ තත්ත්වය, විශේෂයෙන්ම ඔවුන්ගේ ආර්ථික අස්ථාවරත්වය (කාන්තා මූලික කුටුම්භ)
- පක්ෂ දේශපාලනය විසින් අර්ථාන්විත ප්‍රජාතන්ත්‍රවාදී මැදිහත්වීම් යටපත් කිරීම.
- භාෂා බාධකය / නූගත්කම / නොදැනුවත්කම හේතුවෙන් ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය අහිමි වීම.
- පරිපාලන ක්‍රියා පටිපාටි සහ අවශ්‍යතා බිම් මට්ටමේ යථාර්ථයන්ට සංවේදී නොවීම.
- පරිපාලන ව්‍යුහයන් බිම් මට්ටමේ ප්‍රශ්න විසඳීම සඳහා උපකාර නොවීම.
- පරිධිය විසින් සිදු කරනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් කේන්ද්‍රයේ නිරීක්ෂණයක් නොමැතිකම.
- යුද්ධයේ ප්‍රතිවිපාක සඳහා තිරසාර විසඳුම් නොමැතිකම.

[1] ගෘහස්ථ සාමාජිකයින් කිහිප දෙනෙකු වෙසෙන සීමිත ඉඩකඩක් සහිත රේඛීය වශයෙන් එකිනෙකට සම්බන්ධිත නිවාස

- යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් විසින් යෝජනා කරන ලද ඉල්ලීම් සඳහා රාජ්‍ය නිලධාරීන්ගෙන් ප්‍රතිචාර සහ ප්‍රතික්‍රියා නොමැතිකම.

- දේශපාලන අධිෂ්ඨානයක් නොමැතිකම.

## හඳුනාගත් ප්‍රධාන ගැටළු

සාකච්ඡාව අතරතුර නැවත නැවතත් මතුවූ ගැටළුවක් වූයේ ඔවුන්ගේ අයිතිවාසිකම්/හිමිකම් සහ රජයෙන් ඔවුන්ට ලැබිය යුතු ප්‍රතිලාභ පිළිබඳව කාන්තාවන් තුල පවත්නා අවබෝධය මදකමයි. කාන්තාවන් තමන්ට සහනයක් ලබා ගැනීමට පැමිණි අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම සේවක නිලධාරියා සහ කාර්ය මණ්ඩලය හමුවී අත්දැකීම් බෙදාගෙන ඇත. කාන්තාවන් නැවත නැවතත් “රැවටීමට” ලක්ව ඇති අතර, ඔවුන්ගේ දුර්වලතා සහ නොදැනුවත්කම සූරාකෑමට ලක් ව ඇත. ප්‍රතිලාභවලින් කොටසක් ලබා දෙන විට පවා වැඩි ප්‍රමාණයක් ඔවුන්ට අහිමි වේ.

බලධාරීන් මූලික වශයෙන් සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවන් භාවිතා කරන බැවින් භාෂා බාධකය ඉතා ප්‍රබල වේ. දෙමළ භාෂාව පමණක් දන්නා සහ/හෝ නූගත් කාන්තාවන්ට ඔවුන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වේ. ඇතැම් සේවාවන් සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී, භාෂා බාධකය හේතුවෙන් බොහෝ අයදුම්පත් ප්‍රතික්ෂේප වේ. ඒ හැර පරිපාලන ක්‍රියා පටිපාටි හරහා බිම් මට්ටමේ යථාර්ථයන්ට විසඳුම් නොලැබේ. නිදසුනක් වශයෙන්, ඇතැම් කාන්තාවන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ අතර ඔවුන් යාපනයේ සිට මඩකලපුවට රැගෙන ගියහ. එවැනි සංක්‍රමණ හේතුවෙන්, ඇතැම් නිල සේවාවන් වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය නිසි ලියකියවිලි සඳහා ප්‍රවේශය ඔවුන්ට අහිමි වී ඇත. බොහෝ දෙනෙකුට තම ආදරණීයයන්ගේ මරණ සහතික ලබා ගැනීමට නොහැකි වූ අතර, ඉන් ප්‍රශ්නය තවත් උග්‍ර වී ඇත.

මෙම කාන්තාවන්ට බොහෝ වගකීම් දැරීමට සිදුවීම හේතුවෙන් රජයෙන් තමන්ට ලැබිය යුතු ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් වීමට නොහැකිව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ. යුද්ධය නිසා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල විය. යුද්ධයෙන් පසු ඔවුන්ට ගෘහ මූලිකයන් බවට පත්වීමට සිදු විය. ආබාධිත ඥාතීන් රැකබලා ගැනීම, මූල්‍යමය ස්ථාවරත්වය පිළිබඳ වගකීම, තම දරුවන් රැකබලා ගැනීම, රැකියා සඳහා අරගල කිරීම සහ සමස්තයක් වශයෙන් ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීම ඔවුන්ට භාර විය. ජීවනෝපාය අතින් කාන්තාවන්ට කුසළතාවයන්ගෙන් තොර රැකියාවලට යොමු වීමට සිදු විය. ඇතැමුන් පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන මුත් ලාභ ලැබීමට හොඳ වෙළෙඳ පොළක් නොමැති බව ප්‍රකාශ කර සිටියහ.

කාන්තාවෝ ඔවුන් මානසික වධ හිංසාවලට ලක් වූ අවස්ථා පිළිබඳව ද අදහස් පල කළහ. එවැනි එක් සිදුවීමක් වනුයේ කාන්තාවන් සහන ලබාගැනීම සඳහා නිලධාරීන් වෙත ගිය විට මූල්‍යමය ස්ථාවරත්වය ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස “නැවත විවාහ වන” ලෙස නිලධාරීන් කාන්තාවන්ට කියා සිටීමයි. නිලධාරීන් බොහෝ විට පහත් වචන භාවිතා කර කාන්තාවන්ගේ දුක්ගැනවිලි නොසලකා හරිති. යුද්ධයේ දී තම ස්වාමිපුරුෂයන් අතුරුදන් වූ නිසාත්, මරණ සහතිකය තවමත් ලැබී නොමැති නිසාත්, ඇතැම් කාන්තාවෝ තමන් වැන්දඹු ද නැද්ද යන්න පවා හරිහැටි නොදනිති.

මෙම කාන්තාවන්ට තිරසාර රැකියා මාර්ග තිබුණේ නැත. කම්කරුවන් දෛනික වැටුපක් ලබමින් ජීවත් වන බැවින් ඔවුන්ට ණය ආපසු ගෙවීමට හෝ ණය යෝජනා ක්‍රම සඳහා සුදුසුකම් ලැබීමට නොහැකිය. ඔවුන් මියගියහොත් ඔවුන්ගේ ණය ගෙවන්නට කෙනෙක් නැත. හුදකලා වූ කාන්තාවන් හට බොහෝ විට රජයේ කිසිදු සහනයක් නොලැබේ. යැපෙන්නන් නොමැතිකම ඔවුන් නොසලකා හැරීමට හේතුවන ප්‍රධාන සාධකයයි. කෙසේ වෙතත්, ඔවුන්ට තම ජීවිත පවත්වා ගෙන යාමට මාර්ගයක් නොමැත.

කාන්තාවෝ දිනපතා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයට ද ලක් වේ. විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම වල දී සහ කාන්තාවන් තම දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට රාජ්‍ය

නිලධාරීන් වෙත පැමිණෙන විට ලිංගික අල්ලස් වලට ගොදුරු වීම සාමාන්‍ය සිදුවීමකි. විශේෂයෙන්ම වතුකරයේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය බහුලව දක්නට ලැබේ. පැමිණිලි කිරීම සඳහා කාන්තාවෝ ධෛර්යවන්තව පොලිසියට ගියවිට ඔවුන් අත්අඩංගුවට පත්වුවහොත්, පියා හෝ සැමියා නොමැති ඔවුන්ගේ පවුල්වල පැවැත්ම තර්ජනයට ලක්වේ.

1. ආරක්ෂාව නොමැතිකම

   a. ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ඉහවහා ගොස් ඇත. ලිංගික අල්ලස් සහ ගෘහස්ථ හිංසනය සාමාන්‍ය සිදුවීම් වේ.

   b. දේපල සඳහා ඇති අයිතිය අහිමි කිරීමෙන් කාන්තාවෝ තවදුරටත් අවදානමට ලක් වේ.

   c. රජය විසින් පිරිනමනු ලබන ප්‍රතිලාභ සහ අනෙකුත් ආධාර යාන්ත්‍රණ සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප වීම. රජයේ නිළධාරීහු කාන්තාවන්ට මානසික වධ හිංසා පමුණුවන අතර ඔවුන්ගේ නොදැනුවත්කම සහ දුර්වලතා ප්‍රයෝජනයට ගනිමින් ඔවුන්ව මුළා කරති.

   d. අලි-මිනිස් ගැටුම හේතුවෙන් ඔවුන් නිරන්තර භීතියෙන් හා අවිනිශ්චිතතාවයෙන් යුතුව ජීවත් වේ.

2. පොදු සේවාවන් සඳහා ප්‍රවේශය

   a. සෞඛ්‍යය

      - නිදන්ගත වකුගඩු රෝගය.
      - ආවේණික මනෝවිද්‍යාත්මක තත්වාරෝපණය. (උදා: අපි දුප්පත් නිසා අපට ඉගෙනීමට අවශ්‍ය නැත, අපගේ දෙමාපියන්ගේ රැකියාව අපට උරුම වේ)

   b. අධ්‍යාපනය

      - පාසල්වල භෞතික හා මානව සම්පත් හිඟකම.
      - උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා අවම වීම.
      - දෙමාපියන්ගෙන් ප්‍රමාණවත් සහායක් නොලැබීම හේතුවෙන් බිහිවන ළමා ශ්‍රමිකයින්.
      - දෙමාපියන් රැකියාවට යන විට වැඩිහිටි දරුවන් විසින් කුඩා දරුවන් රැකබලා ගතයුතු යැයි අපේක්ෂා කරන දෙමාපියන් විසින් ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම.

   c. ජලය හා සනීපාරක්ෂාව

      - පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට බොහෝ දුර පයින් යාමට සිදුවීම.
      - අපිරිසිදු ජලය පානය කිරීමට සිදුවීම.
      - ජලය බෙදා හැරීමේ ක්‍රමයක් නොමැති වීම.

3. ආර්ථිකය

a. කාන්තාවන් සූරාකන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම.

b. විශේෂයෙන්ම කාන්තා මූලික නිවාසවල තිරසාර ජීවනෝපායන් නොමැතිකම නිසා රජයේ අරමුදල් මත සම්පූර්ණයෙන්ම යැපීම.

c. සමෘද්ධි දීමනා, වැඩිහිටි දීමනා ආදිය ලබාදීමේ දී වෙනස් කොට සැලකීම සහ ඒවාට ප්‍රවේශය නොමැතිකම.

d. ශ්‍රමය සූරාකෑම සහ වැටුප් සම්බන්ධයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් හට වෙනස්කොට සැලකීම. (වැටුප් පරතරය)

4. නිවාස

a. ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී සිදුවන වෙනස්කොට සැලකීම්.

b. ජීවත්වීමට සුදුසු තත්වයන් හෝ නිසි යටිතල පහසුකම් නොමැති නිවාස සැලසුම්.

c. මෑත කාලීන කොවිඩ් වසංගතය හමුවේ අභියෝග රැසක් ඉස්මතු කල 'ලයින් කාමරවල' පහත් තත්වයන්.

d. නැවත පදිංචි කරන ලද භූමිය වාසයට නුසුදුසු වීම (ජලය රඳා පවතින තෙත් බිම්).

5. දූෂණය

a. පොදු සේවාවන් බෙදා හැරීමේ අසමානතාවය.

b. රජයේ නිලධාරීන් අතර අල්ලස හා දූෂණය.

## ප්‍රතිපත්තිමය ඇඟවුම් සහ නිර්දේශ

- **ජීවනෝපාය ආධාර සැපයීම:** වෛද්‍ය පහසුකම්, පානීය ජල පහසුකම්, දරුවන්ට අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික පහසුකම් සැපයීම සහ දුෂ්කර ප්‍රදේශවල විපතට පත් කාන්තාවන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම. ඉහත සාධක නොමැතිකම නිසා ඔවුන් ගැටලු රාශියකට මුහුණ දී සිටින අතර, මෙම ගැටළු මඟහරවා ගැනීම පිළිබඳ සහ ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට කතා කළ යුතු ආකාරය පිළිබඳ ඔවුන් දැනුවත් කල යුතුය.

- **තෙත්බිම් හැර වෙනත් සුදුසු ඉඩම් ලබා දීම:** විපතට පත් ජනතාවට ලබා දෙන නිවාස බොහෝ විට ජලයෙන් යටවන බවක් දක්නට ලැබේ. ඒවා පදිංචියට නුසුදුසු බව පෙනී යයි. ඔවුන්ට නවාතැන් සහ සනීපාරක්ෂක පහසුකම් ලබා දිය යුතුයි.

- **විපතට පත් කාන්තාවන්ට ස්වයං රැකියා කුසලතා සහ පුහුණුව ලබා දීම:** බොහෝ පීඩාවට පත් කාන්තාවන්ට ඔවුන්ගේ දෛනික ආදායම් මාර්ගය වූ තම ස්වාමිපුරුෂයා, පියා සහ සහෝදරයන් අහිමි වී ඇත. එවැනි කාන්තාවන්ට ස්වයං රැකියාවක් කිරීමට දිරිගැන්වීම් සහ පෙළඹවීම් ලබා දිය යුතුය.

- **ස්වයං රැකියා පිළිබඳ පුහුණුව:** ස්වයං රැකියා ලබා දීම සඳහා රජයට යුද්ධයෙන් විපතට පත් කාන්තාවන් සඳහා වැඩමුළු ආරම්භ කළ හැකි අතර ඔවුන්ගේම ස්වයං රැකියා මූලාරම්භයන් ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණුවක් ලබා දිය හැකිය. රැකියා ලබා දීම සඳහා කර්මාන්තශාලා සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමට ද රජයට හැකිය. විකල්පයක් වශයෙන්, රජයට පෞද්ගලික කර්මාන්තශාලා සමඟ සම්බන්ධ වී ඔවුන්ගේ හැකියාවන් සහ කුසලතා අනුව රැකියා ලබා දිය හැකිය.

- **විශේෂ කණ්ඩායමක් පිහිටුවීම:** යුද්ධයෙන් විපතට පත් කාන්තාවන් රැකබලා ගැනීම සහ ඔවුන්ගේ දීමනා සහ වන්දි නිසි ලෙස බෙදා හැර තිබේද යන්න නිරීක්ෂණය කිරීම සහ පසු විපරම් කිරීම සඳහා විශේෂ කණ්ඩායමක් පිහිටුවීම. රාජ්‍ය නිලධාරීන් දූෂණය සහ අල්ලස් (ලිංගික අල්ලස්) සම්බන්ධ ගැටලු පිළිබඳව අවංකව වාර්තා කළ යුතු අතර, කාන්තාවන් සඳහා පිළියම් පියවර ඇති කල යුතුය.

- **නිශ්චිත පුද්ගල කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය:** යුද්ධයෙන් විපතට පත් වූවන්ට අගතියකින් තොරව වන්දි ලබා දීම රජයේ වගකීමකි. එසේ කිරීමේදී, වැඩිහිටි හා ගැබිනි කාන්තාවන්, වැන්දඹුවන් සහ කාන්තා ගෘහ මූලිකයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. අදාල වන්දිය අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කරන බව සහතික කිරීම සඳහා රජය විසින් අධීක්ෂණ පියවර ක්‍රියාත්මක කළ යුතුය.

- **අයදුම් පත්‍ර භාෂා තුනෙන්ම ලබාගත හැකිවිය යුතුය:** වන්දි ඉල්ලා සිටීමට නිසි ලියකියවිලි නොමැති අයට ද හානිපූරණයන් ලබාදීමට කටයුතු කළ යුතුය. වන්දි සඳහා වන අයදුම්පත් පවතින්නේ එක් භාෂාවකින් පමණක් බැවින්, අදාළ අයදුම්පත් භාෂා තුනෙන්ම (ඉංග්‍රීසි, දෙමළ සහ සිංහල) සකස් කල යුතුය.

- **නිසි අයුරින් යුක්තිය පසිඳලීම:** කිසිදු දේශපාලන ප්‍රභූන්ගේ සහභාගීත්වයෙන් තොරව, ප්‍රබල සම්පත් සහ තාක්ෂණික විශේෂඥ දැනුමක් සහිතව අල්ලස් නඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. බොහෝ රාජ්‍ය නිලධාරීන් දූෂිතයන් බවත්, අල්ලස් ගැනීම් සහ යුක්තිය අවභාවිතය තම ප්‍රදේශවල බහුලව සිදුවන බවත් කාන්තාවන් ප්‍රකාශ කර ඇත.

- **දැනුවත් කිරීම:** ජනතාවට රජයෙන් ලැබෙන ප්‍රතිලාභ, ආධාර, සහාය සහ අරමුදල් පිළිබඳව ජනතාව දැනුවත් කළ යුතුය. සහය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු බහුවිධ ක්‍රියා පටිපාටි පිළිබඳව ජනතාව බොහෝ විට නොදන්නා නිසාත්, තම පවුල් නඩත්තු කිරීම වැනි වෙනත් ප්‍රමුඛතා ඇති නිසාත්, ඔවුන් දිගු කලක් වෙහෙස මහන්සි වී වැඩ කරති. රජයෙන් ඔවුන්ට ලබා දෙන ආධාර ගැන

ඔවුන් නොදනිති. අදාළ බලධාරීන් තම යුතුකම් පැහැර හරින විට හෝ ඊට පහසුකම් සැලසීමට අපොහොසත් වූ විට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වන ආසන්නතම ආයතන හැර ළඟා විය යුතු වෙනත් අය කවුරුන්දැයි යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතුය.

- **අවසානය:** කාන්තාවන්ට ඔවුන්ගේ ආදරණීයයන්ගේ මරණය හෝ ඔවුන්ට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳ සහතිකයක් ලබා දීම. එල්.ටී.ටී.ඊ සංවිධානයට සම්බන්ධ බවට අත්අඩංගුවට ගත් තම ස්වාමිපුරුෂයන් ජීවතුන් අතර සිටින බව යුද්ධයෙන් පීඩාවට පත් බොහෝ කාන්තාවෝ තවමත් විශ්වාස කරති. එබැවින් රජය ඔවුන් ජීවතුන් අතර සිටීද නැද්ද යන්න ඔප්පු කර අර්ථවත් යුක්තියක් සහ සුදුසු හානිපූරණයන් ලබා දිය යුතුය. මෙම කාන්තාවන්ට ඉදිරියට යාමට නම් තිරසාර විසඳුම් ලබාදිය යුතුයි.

## ක්‍රියාත්මක වීම

යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව දිගින් දිගටම කොන් කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රතික්ෂේප කිරීම යන පදනම මත, පහත සඳහන් ක්‍රියාකාරී නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සම්පාදකයින්ගෙන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් අපි මහත් උනන්දුවෙන් ඉල්ලා සිටිමු.

i ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින යුද්ධයෙන් විපතට පත් කාන්තාවන්ගේ යථාර්ථය පිළිබඳව ගැඹුරු පර්යේෂණාත්මක විශ්ලේෂණයක් පැවැත්වීම;

ii දැනට පවතින පරිපාලන ක්‍රියා පටිපාටි සහ අවශ්‍යතා බිම් මට්ටමේ යථාර්ථයන්ට අනුව සංශෝධනය කර අනුගත කිරීම;

iii නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව සහ පැහැරහැරීම් සඳහා පිළියම් ලෙස පැමිණිලි යාන්ත්‍රණ සහ වගවීමේ ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීම;

iv විපතට පත් ජනතාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මගින් පැහැදිලි කරන ලද බරපතල තත්වයන් ආමන්ත්‍රණය කිරීම;

v බලපෑමට ලක් වූ ප්‍රදේශවල සුභසාධනය සහ මූලික ජීවන තත්ත්වයන් සුරක්ෂිත කිරීමට කඩිනම් පියවර ගැනීම;

vi ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කරන සහ අවදානමට ලක්වූවන් සූරාකන මැර බලධාරීන් වගවීමට නතු කිරීම; සහ

vii යුද්ධයේ ප්‍රතිවිපාක සඳහා තිරසාර විසඳුම් ක්‍රියාවට නැංවීම සඳහා මෙම ගැටළු විසඳීමට ඇති දැඩි අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් මෙම ජනතාවගේ ස්වයං නිර්ණය සහතික කිරීම.

## පහත සඳහන් විශ්වවිද්‍යාලවල සිසුන් විසින් මෙම වාර්තාව සම්පාදනය කරන ලදී

**කොළඹ විශ්වවිද්‍යාලය**

නයෝමි විජේසුන්දර මිය
තලේගම්පල ගමගේ ඉමල්කා තරුෂි මිය
එම්. ආර්. කලණ ගයන්ත මහතා
දිනිති සිල්වරින් ද අල්විස් එදිරිසිංහ මිය - ශිෂ්‍ය සම්බන්ධීකාරක

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

දිවාගරාණි මුනීස්වරන් මිය
මේරි දානියා ඇන්ටන් කොන්චාල්ස් මිය
සෙල්වරාජ් සිවකුමාර් මහතා
සිවම් විතූර්ෂන් මහතා
සිත්මි අත්තනායක මිය - ශිෂ්‍ය සම්බන්ධීකාරක

**යාපනය විශ්වවිද්‍යාලය**

නිරෝෂා පිලිප් මිය
පිරාර්ථනා බාලබවන් මිය
ගුණසිංහරාජා මහේෂ්වරලිංගම් මහතා
බනුජා සිවානන්දම් මිය - ශිෂ්‍ය සම්බන්ධීකාරක

**අග්නිදිග විශ්ව විද්‍යාලය**

මොහොමඩ් ෆාසිල් හස්මත් ෆහීමා මිය
ඉෂාක් මහීෂා බානු මිය
අබ්දුල් අෆාර් මොහොමඩ් නෂීත් මහතා
මුහම්මදු අමීර් මාරියම් මිය - ශිෂ්‍ය සම්බන්ධීකාරක

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**

නො. 325 A 1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව

දුරකථන/ ෆැක්ස්: +94 11 2055404

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/Centre-for-Equality-and-Justice

/cej_srilanka

/CEJ_SriLanka

/channel/CEJ Sri Lanka